ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2016-8-15 |

පැමිණිලිකාරිය : වඩුගේ ගුණවති පෙරේරා මිය.
අංක 177/1, කුරුප්පුමුල්ල.
පානදුර.

වගඋත්තරකරුවන් : 01. උ.පො.ප. නිශාන්ත කුමාර මහතා.
පොලිස් ස්ථානය.
පානදුර දකුණ.

02. පො.කො.39811 අබේසේකර මහතා.
පොලිස් ස්ථානය.
පානදුර දකුණ.

<u>පැමිණිලි අංකය</u> : **<u>HRC/2003/12</u>**

**පැමිණිල්ල :-**

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, 2012-05-21 වන දින පස්වරු 3.30ට පමණ පොලිස් නිලධාරීන් දෙදෙනෙකු යතුරු පැදියකින් තම නිවසට පැමිණ ඉඩම් ආරවුලක් සම්බන්ධයෙන් විභාග කිරීම සඳහා 2012-05-22 වන දින පෙරවරු 9.00ට පානදුර පොලිස් ස්ථානයට පැමිණෙන ලෙස වාචිකව දැනුම් දීම කළ බවයි. නමුත් එසේ දැනුම් දීම් කර තිබියදී 2012-05-21 වන දින රාත්‍රී 11.00ට පමණ සිවිල් ඇඳුමින් සැරසුණු තිදෙනෙකු නිවසට පැමිණ තම ස්වාමියා සම්බන්ධයෙන් විමසීම් කල බවත්, එම අවස්ථාවේදී ඔහු නිවසේ නොසිටි අතර, තමා සමග සරස්වති නැමැති කාන්තාවක් තම සහයට නිවසේ රඳවා ගෙන සිටි බවත් ප්‍රකාශ කර ඇත. මෙම නිලධාරීන් තමා සහ සරස්වති නැමැති කාන්තාව රැගෙන ගිය අතර, මඳ දුරක් ගිය පසු පොලිස් වාහනයට නගින ලෙස අණ කල බවත්, එම වාහනය තුළ නිල ඇඳුමෙන් සැරසුණු පොලිස් නිලධාරියකු සිටි අතර, පසුව තමන් දෙදෙනාව පානදුර පොලිස් ස්ථානයට රැගෙන ගිය බවත් සඳහන් කර ඇත. මෙසේ රැගෙන ගොස් දින 14ක් රිමාන්ඩ් කරන කරන බවට කෲර ලෙස අඩම්තෝට්ටම් සහ වධහිංසා කළ බවද පැමිණිල්ලෙන් සඳහන් කර ඇත. තම ඥාතීන් තොරතුරු සොයා බැලීමේදී ස්ථානයට එවැනි




| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office | 165, කින්සි පාර, කොළඹ - 08. / 165, கின்சி வீதி, கொழும்பு - 08. / 165, Kynsey Road, Colombo - 08. | සභාපති / தவிசாளர் / Chairman | 011-2696470 | ෆැක්ස් / தொலைநகல் / Fax | 011-2696470 | ඊමේල් / மின்னஞ்சல் / e-mail | sechrc@sltnet.lk |
| දුරකථන / தொலைபேசி / Telephone | 94 - 11 - 2694925, 2685980, 2685981 | ලේකම් / செயலாளர் / Secretary | 011-2689558 | ක්ෂණික / துரித அழைப்பு / Hotline | 011-2689558, 1996 | වෙබ් / இணையம் / Web | www.hrcsl.lk |

අයෙකු ගෙනවිත් නොමැති බවට ප්‍රකාශ කර ඇති බවද දක්වා ඇති අතර, පෙත්සම්කාරිය විසින් මෙම කරුණු සඳහන් කරමින් නීතියට පරිබාහිරව තමා අත්අඩංගුවට ගැනීමෙන් අපකීර්තියක් හා නින්දාවක් සිදු වූ බවට දන්වා ඇත.

පෙත්සම්කාර ගුණවතී නැමැත්තිය තවදුරටත් සඳහන් කර ඇත්තේ, ආරවුලට මැදිහත් වූ අසල්වැසි තැනැත්තියක් වන සුසිලා විසින් හදිසි ඇමතුම් අංක 119 කරන ලද දැනුම්දීම හේතුවෙන් 2012-05-21 වෙනි දින පස්වරු 3.00ට පමණ නිලධාරීන් තම නිවසට පැමිණ පසුදින පොලිස් ස්ථානයට පැමිණෙන ලෙස දන්වා ඇති බව රාත්‍රී නිවසට පැමිණි නිලධාරීන් හට පැවසූ බවත්, එම අවස්ථාවේදී අබේසේකර මහතා විසින්, එසේ නම් පසු දින පැමිණෙන ලෙස ප්‍රකාශ කළ බවත්, නමුත් සුළු මොහොතකින් තවත් නිලධාරියකු සමග නැවත තම නිවසට පැමිණ ඉහත ආකාරයෙන් අත්අඩංගුවට ගැනීම සිදු කළ බවය.

කොමිෂන් සභා පරීක්ෂණ අවස්ථාවේදී සරස්වතී අම්මා නැමැත්තිය විසින් සඳහන් කර ඇත්තේ පෙත්සම්කාරියගේ සහයට ඇයගේ නිවසට පැමිණි බවත්, පොලිස් නිලධාරීන් විසින් 2012-05-21 වන දින රාත්‍රී 11.00ට පමණ දෙදෙනාම පොලිස් ස්ථානයට රැගෙන විත් රාත්‍රී 1.00 දක්වා උඩුමහලේ රඳවා තබාගැනීමෙන් පසු පහළ මහලයට රැගෙන විත් පසු දින වන තුරු රඳවා තැබූ බවත්ය. පසු දින එනම් 2012-05-22 වන දින පොලිස් පොතේ අත්සන් කිරීමෙන් පසු තමා නිවසට ගිය බවත්, රඳවා සිටි කාලය තුළදී කිසිදු පහරදීමක් සිදු නොවූ බවත් දක්වා ඇත.

පෙත්සම්කාර පාර්ශවයේ කරුණු තහවුරු කිරීම සඳහා දිවුරුම් ප්‍රකාශ ඉදිරිපත් කරන ලෙස ලබා දී ඇති උපදෙස් අනුව පෙත්සම්කාරියගේ ස්වාමියා වන අගම්පුලි ඩැරල් ශ්‍රීපාලිත සිල්වා නැමැත්තාගේ සාක්ෂි ඉදිරිපත් කොට ඇත. එහි සඳහන් පරිදි තම භාර්යාව වන ගුණවතී නැමැත්තිය රෝගී තත්ත්වයෙන් පෙළෙන බවත්, අත්අඩංගුවට ගැනීම හේතු කොට ගෙන ඇයට ලැබිය යුතු ප්‍රතිකාර ලබා ගැනීම නිසිලෙස සිදු වී නොමැති බවත් දක්වා ඇත. එමෙන්ම මානුෂික වධහිංසනයට ලක් කළ බවද සඳහන් කර ඇත.

**වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

ඉහත පැමිණිල්ලට අදාළව 2012-05-30 දිනෙන් මූලස්ථාන පොලිස් පරීක්ෂක පානදුර මගින් වාර්තා කැඳවා ඇති නමුත් එකී තොරතුරු ලබා නොදීම හේතුවෙන් 2012-08-17 වෙනි දිනට පාර්ශවයන් කැඳවා ඇත. මෙදින 01 වගඋත්තරකරු වශයෙන් නම් කර ඇති උ.පො.ප. නිශාන්ත කුමාර පරීක්ෂණය සඳහා ඉදිරිපත්ව නොමැති අතර, පො.කො 39811 ආර්.එම්. අබේසේකර මහතා ඉදිරිපත් වෙමින් මෙම පෙත්සම්කාරිය සහ ඇයගේ ස්වාමියාට විරුද්ධව අපරාධ සටහන් ලේඛනයේ GCIB 258/502 යටතේ 2012-05-21 වන දින සිට පැමිණිල්ලක් සටහන් කර තිබූ

බවය. ඒ අනුව උ.පො.ප. නිශාන්ත කුමාර මහතාගේ ප්‍රමුඛත්වයෙන් 2012-05-21 වෙනි දින රාත්‍රී 10.00ත් 11.00ත් අතර කාලයේදී පොලිස් ස්ථානයෙන් පිටවූ බවත්, පෙත්සම්කාරියගේ නිවසට රාත්‍රී 11.30ට පමණ ලගා වූ බවත් දක්වා ඇත. මෙම අවස්ථාවේදී පෙත්සම්කාරියගේ ස්වාමියා නිවසේ නොසිටි අතර, පොලිස් ස්ථානයට ලැබී තිබූ පැමිණිල්ලේ පෙත්සම්කාර ගුණවති යන තැනැත්තියද වගඋත්තරකරුවකු ලෙස සඳහන්ව තිබූ හෙයින් එම අවස්ථාවේදී ඇය අත්අඩංගුවට ගැනීම සිදු කල බවත්, ඇයගේ සහයට සිටි සරස්වති තැනැත්තියද ගුණවතිගේ ආරක්ෂාව සම්බන්ධයෙන් කැටුව පැමිණි බවත් දක්වා ඇත.

2012-05-21 වන දින යම් ආරවුලක් සම්බන්ධයෙන් පොලිස් ස්ථානයේ පැමිණිලි සටහන් කර ඇති බව පරීක්ෂණ අවස්ථාවේදී අනාවරණය වී ඇත. මෙවැනි ගැටළුවක් සම්බන්ධයෙන් එදිනම කාන්තාවන් අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් විමසීමේදී වගඋත්තරකාර අබේසේකර මහතා සඳහන් කර ඇත්තේ, මංකොල්ලකෑම සහ පහරදීමක් සම්බන්ධයෙන් ඉහත අංක දරණ පැමිණිල්ල 2012-05-21 වෙනි දින ලැබී තිබූ අතර, පැමිණිල්ලේ ස්භාවය අනුව එදිනම අදාල විමර්ශන සිදු කල බවය. තවදුරටත් අබේසේකර මහතා ප්‍රකාශ කර ඇත්තේ, මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් පොලිස් ස්ථානයට පැමිණෙන ලෙස අදාල පාර්ශවයන්ට දැනුම් දීම් කර තිබූ බව තමා දැනුවත්ව නොසිටි බවය. තවදුරටත් මෙම නිලධාරියා කොමිසම ඉදිරියේ සඳහන් කරනුයේ තමා 2012 පෙබරවාරි මස පානදුර පොලිස් ස්ථානයේ අපරාධ අංශයට අනුයුක්තව රාජකාරි කිරීමට සිදු වූ නමුත්, මේ වනවිටද තමා පරිපාලන කටයුතු සම්බන්ධයෙන් හරියාකාරව දැනුමක් ලබා නොතිබූ බවත් උසස් නිලධාරීන්ගේ උපදෙස් මත තම රාජකාරියේ නියැලීමෙන් කටයුතු කල බවත්ය.

**මානව හිමිකම් කොමිෂන් සභා විමර්ශනය :-**

විමර්ශන අවස්ථාවන්හිදී අනාවරණය වූ කරුණු අනුව උ.පො.ප.නිශාන්ත නිලධාරියා මෙම අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් ප්‍රමුඛව කටයුතු කර ඇත. ඒ අනුව 2012-08-17, 2012-09-13, 2012-10-18, 2012-11-23 සහ 2013-01-31 වන දිනට එම අය කොමිෂන් සභාව වෙත කැඳවා ඇත. මෙහිදී අබේසේකර නිලධාරී සෑම අවස්ථාවක කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වී ඇති නමුත් විමර්ශනයේ ප්‍රමුඛත්වය ගෙන කටයුතු කරනු ලැබූ උ.පො.ප.නිශාන්ත කුමාර මහතා 2013-01-31 වන දින හැර ඊට ප්‍රථම කැඳවනු ලැබූ සියලූ අවස්ථා මගහැර ඇති බව නිරීක්ෂණය වේ.

මෙදින එනම් 2013-01-31 වන දින පළමු වගඋත්තරකරු වන නිශාන්ත මහතාගෙන් සැකකාරියන් අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් කරුණු විමසීමේදී පෙත්සම්කාරිය සහ ඇයගේ ස්වාමියා අසල්වැසි නිවසකට ඇතුළු වී මංකොල්ලකෑමක් පිළිබඳව GCIB 256/499 යටතේ ලද පැමිණිල්ලට අනුව ස්ථානයෙන් පිටව ගිය බවත්, මෙසේ රාජකාරියේ නියැලී සිටියදී පො.කො.287

**අමිත් නිලධාරියා විසින් කුරුප්පුමුල්ල ස්ථානයේ මංකොල්ලයක් සිදු වන බවට දුරකථනය මගින් තමා දැනුවත් කළ බවත් සදහන් කර ඇත.**

ඒ අනුව පො.කො. 39811 අබේසේකර මහතා සමග අදාල ස්ථානයට 2012-05-21 වන දින පැය 22.30ට ලගා වූ බවත්, ස්ථානගත පරීක්ෂණයේදී අදාල නිවසේ භාණ්ඩ තැනින් තැන විසිරී තිබූ බව තමාට නිරීක්ෂණය වූ බවත් සදහන් කර ඇත. එමෙන්ම සුසිලා නැමැත්තියට පහරදීමක් සම්බන්ධයෙන් තමාට නිරීක්ෂණය වූ අතර, ඇයගේ ස්වාමියා පානදුර රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබන බවටත්, පැමිණිල්ලෙන් සදහන් කර තිබූ බවත් දක්වා ඇත. 2012-05-22 දින පැය 10.00ට සුසිලා නැමැත්තියගේ ස්වාමියාගෙන් රෝහලේදී ප්‍රකාශයක් ලබා ගෙන ඇති බවත් සදහන් කර ඇත.

වගඋත්තරකාර පාර්ශවය විසින් ලබා දී ඇති වාර්තාවට අනුව මංකොල්ලකෑමක් සම්බන්ධයෙන් පැමිණිල්ලක් ලැබී තිබූ නමුදු, පැමිණිල්ලේ විමර්ශන කටයුතු සිදු කිරීමෙන් පසු එවැනි කොල්ලකෑමක් හෙළිදරව් නොවූ හෙයින්, 2012-05-22 වන දින පැය 11.00ට පොලිස් ඇප මත නිදහස් කල බව ස්ථානාධිපති අපරාධ විමර්ශන අංශය පානදුර- දකුණ මගින් දැනුම් දී ඇත.

**නිරීක්ෂණ :-**

ගුණවති නැමැත්තිය සමග ආරවුලට සම්බන්ධ වූ යැයි සදහන් කරන ඊබට් සිල්වා නැමැත්තා පානදුර රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබා ගන්නා කාලය තුළදී පානදුර පොලිස් ස්ථානය මගින් ප්‍රකාශ ලබා ගෙන ඇති අතර, පැමිණිලිකාරිය ගුණවති නැමැත්තියගෙන් කිසිදු පහරදීමක් සිදු නොවූ බව ප්‍රකාශයේ සදහන්ව ඇත. ඒ අනුව අදාල නැනැත්තිය අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශවයෙන් කරුණු විමසීමේදී මැය අයුතු ඇතුල්වීමක් සිදු කර තිබූ හෙයින් අත්අඩංගුවට ගැනීම සිදු කල බවට වගඋත්තරකාර පාර්ශවයෙන් කරුණු දක්වා ඇත. තවද සරත්වති අම්මා නැමැත්තිය සම්බන්ධයෙන් සදහන් කරනු ලැබ ඇත්තේ සැකකාර ගුණවති නැමැත්තියගේ ආරක්ෂාව සම්බන්ධයෙන් සරත්වති රැගෙන ආ බවයි.

වඩුගේ ගුණවති නැමැත්තිය සහ ඇයගේ ස්වාමිපුරුෂයා වන ඩැරල් යන අයට විරුද්ධව "සුසුලාවතී නැමැත්තියගේ ස්වාමියාට පහරදීමක් හා මංකොල්ලකෑමක් සම්බන්ධයෙන්" 2012-05-21 වන දින පොලිස් ස්ථානය වෙත පැමිණිල්ලක් කර ඇති බව නිරීක්ෂණය වේ. මෙම හේතු කාරණා මත නිශාන්ත කුමාර ඇතුළු නිලධාරීන් විමර්ශනය කිරීමේදී ඩැරල් නැමැත්තා නිවසේ නොසිටි බවත්, වඩුගේ ගුණවති පෙරේරා යන අයද මෙම ආරවුලට මැදිහත් වී තිබීම යන කාරණය මත මෙම අත්අඩංගුවට ගැනීම සාධාරණිය කිරීමට වගඋත්තරකරුවන් උත්සහ ගෙන ඇති බව පැහැදිලි වේ.

තවද ඉහත අංකය යටතේ පොලිස් ස්ථානයේ ගොනු කරන ලද අදාළ පැමිණිල්ලේ ප්‍රධාන වගඋත්තරකරුවකු ලෙස ඩැරල් නැමැත්තා සඳහන්ව ඇති නමුදු පොලිස් නිලධාරි විසින් මෙම නැනැත්තා සම්බන්ධයෙන් පසුව හෝ කිසිදු විමර්ශනයක් සිදු කර නොමැති බවට කොමිෂන් සභා විමර්ශන අවස්ථාවන්හිදී මනාව පැහැදිලි වී ඇත.

පොලිස් ස්ථානයේ ගොනු කරන ලද පැමිණිල්ලට අනුව 2012-05-22 වන දින කැඳවීම් කර තිබියදී ඊට පෙර දින එනම් 2012-05-21 දින රාත්‍රී රාජකාරියේ නිරතව සිටි නිලධාරින් විසින් අදාළ පාර්ශවය අත්අඩංගුවට ගැනීම සිදු කර ඇති බවට කරුණු අනාවරණය වී ඇති අතර, නිසි පරීක්ෂණයකින් තොරව අත්අඩංගුවට ගැනීම සිදු කර ඇති බව පැහැදිලි වේ. සරස්වතී නැමැත්තිය අත්අඩංගුවට ගැනීමක් අනාවරණය නොවන අතර, ඇය සැකකාර (පැමිණිලිකාරිය) ගුණවති නැමැත්තියගේ සහයට සිටි කාන්තාව බවත් ගුණවති නැමැත්තිය පොලිස් ස්ථානයට තනිව පැමිණීමට නොහැකි බව දන්වා සිටියදී ඇයගේ ආරක්ෂාවට සරස්වතී යන අයව කැටුව පැමිණ ඇති බවත් නිරීක්ෂනය වේ. පැමිණිල්ලේ ස්භාවයට අනුව ක්ෂණිකවම අත්අඩංගුවට ගැනීමක් සිදු කල යුතු බව වගඋත්තරකාර පාර්ශවය පෙන්වා දීමට උත්සහ කර ඇති නමුත් අදාළ විමර්ශන කටයුතු නිසියාකාරව සිදු කිරිමකින් තොරව මෙම කාන්තාව අත්අඩංගුවට ගැනීම සිදු කර ඇති බවට කරුණු පැහැදිලි වේ. පසු දින ගුණවති නැමැත්තිය පොලිස් ඇප මත නිදහස් කර ඇති අතර, සැකකාර ගුණවති නැමැත්තිය අසල්වැසි පාර්ශවයක් සමග සිදු වූ ආරවුලක් මත පානදුර මහේස්ත්‍රාත් අධිකරණය වෙත බී 05925 යටතේ දේපළ කොල්ලකෑම් සම්බන්ධයෙන් අධිකරණයට කරුණු වාර්තා කර ඇති බව අදාළ සටහන් නිරීක්ෂණය කිරිමේදී පැහැදිලි වේ.

**නිගමනය :-**

ඉහත කරුණු සම්බන්ධයෙන් අධ්‍යනය කිරිමේදී පාර්ශවයන් දෙකක් අතර ඇති වූ ආරවුලක් මත පොලිස් ස්ථානය වෙත පැමිණිලි කර ඇති අතර, එම පැමිණිල්ල විභාග කිරීම සඳහා 2012.05.22 දින පොලිස් ස්ථානය වෙත පැමිණෙන ලෙසට අදාළ පාර්ශවයන් වෙත දන්වා තිබියදීත් (පැමිණිලිකාරියටද) ඊට පෙර දින රාත්‍රියේ එනම්, 2012-05-21 වන දින රාත්‍රී 11.00ට පමණ මෙම සැකකාර ගුණවති නැමැත්තිය අත්අඩංගුවට ගෙන ඇති බවට පැහැදිලි වේ. මෙමගින් පෙනී යන්නේ යම් පැමිණිල්ලක් පොලිස් ස්ථානයට ලැබී තිබුණද එකී පැමිණිල්ල නිසි පරීක්ෂණයකින් තොරව රාත්‍රී රාජකාරියේ යෙදී සිටි නිලධාරින් විසින් අත්අඩංගුවට ගැනීම සිදු කර ඇති බවය.

මෙම අවස්ථාවේදී සිද්ධියට සම්බන්ධවූයැයි සඳහන් කරන ගුණවති නැමැත්තියගේ ස්වාමියා වන ඩැරල් නැමැත්තා නිවසේ සිට නොමැති අතර, එම අවස්ථාවේ නිවසේ රැදී සිටි කාන්තාවන් දෙදෙනා පමණක් වගඋත්තරකාර පාර්ශවය විසින් රැගෙන ආ බවට පැහැදිලි වේ.

එමෙන්ම ඉන් අනතුරුවද ප්‍රධාන සැකකරුවකු ලෙස පැමිණිල්ලේ සඳහන් කර තිබූ ඩැරල් නැමැත්තා සම්බන්ධයෙන් පොලිස් ස්ථානය මගින් නිසි පරීක්ෂණයක් සිදු කර නොමැති බව විමර්ශන අවස්ථාවන්හිදී අනාවරණය වී ඇත. එමෙන්ම අධිකරණයට කරුණු වාර්තා කිරීමෙන් අනතුරුවද මෙම පුද්ගලයා සම්බන්ධයෙන් නිසි විමර්ශනයක් සිදු කර නොමැති බව නිරීක්ෂණය වී ඇත.

තවද සැකකාර ගුණවති නැමැත්තිය අසනීප තත්ත්වයෙන් පෙළෙන තැනැත්තියක් බවට ඇයගේ ස්වාමි පුරුෂයා විසින් කොමිෂන් සභාව වෙත ලබා දී ඇති දිවුරුම් ප්‍රකාශයට අනුව පැහැදිලි වේ. ඒ අනුව ඔහු සඳහන් කරනුයේ තම බිරිඳ අසනීප තත්ත්වයෙන් පෙළෙන අතර, දෛනිකව ලබා දීමට නියමිතව තිබූ ප්‍රතිකාර අත්අඩංගුවට ගත් දින රාත්‍රියේ ඇයට ලබා දීමට නොහැකි වූ බවය. පො.කො. 39811 අබේසේකර නිලධාරියා දීර්ඝ කාලයක් උතුරු ප්‍රදේශයේ ක්‍රියාත්මක රාජකාරියේ කටයුතු කළ නිලධාරියකු බවට අනාවරණය වූ අතර, පරිපාලන හා විමර්ශන කටයුතු සම්බන්ධයෙන් ඔහු නිසි අවබෝධයක් නොලද බවත් කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රකාශ කර ඇත. කෙසේ නමුත් එවැනි නිලධාරීන් විමර්ශනයන්ට සහභාගී කරවීමේදී ස්ථානයේ වගකිව යුතු නිලධාරීන් ලෙස ස්ථානාධිපති හෝ අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති විසින් අදාළ නිලධාරීන් දැනුවත් කර තිබිය යුතු අතර, එසේ සිදු කිරීමක් සිදු වී නොමැත. ඒ අනුව අදාළ බලධාරීන් ලෙස මූලස්ථාන පොලිස් පරීක්ෂකගේ වගකීම නිසියාකාරව සිදු කර නොමැති බවට නිරීක්ෂණය වේ.

කෙසේ නමුදු ඉහතින් අනාවරණය වූ කරුණු අනුව පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලට අනුව වගඋත්තරකාර පාර්ශවය ක්‍රියා කිරීමේදී නීතියෙන් නියම කරන ලද කාර්ය පටිපාටියට පරිබාහිරව කටයුතු කිරීම තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) වන ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති මූලික අයිතිවාසිකම පැමිණිලිකාර පාර්ශවය සම්බන්ධයෙන් උල්ලංඝනය වී ඇති බවට පරීක්ෂණයෙන් අනතුරුව තීරණය කරනු ලැබේ.

නිර්දේශය :-

01. වගඋත්තර පාර්ශවය විසින් පැමිණිලිකාරියට රු. 25,000/-ක වන්දි මුදලක් ගෙවිය යුතුය.

02. මෙහි පිටපතක් අවශ්‍ය ඉදිරි පියවර ගැනීම සඳහා පොලිස්පතිවරයා වෙතද යොමු කරනු ලැබේ.

2016.09. 15 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර. එදිනට හෝ එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

සභාපති.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Dr. N. D. Udagama**
**Chairperson**
Human Rights Commission of Sri Lanka

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

සැ.යු :- අදාල මුදල් "මුදල් ඇණවුමක්" මගින් පැමිණිලිකාරිය වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සැලැස්විය යුතුය.

B/..